# නිවැරදි ආරම්භය

# පටුන


**1. හැඳින්වීම .......... 1**

**2. ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථානඅදාළ සංකල්ප සහ මූල ධර්ම .......... 4**

2.1 හැඳින්වීම .......... 4

2.2 ''සංවර්ධන ක්‍රියාවලියේ'' මූලික ලක්ෂණ .......... 4

2.3 ''ළමා මිතුරු වීම'' යන්නෙන් කුමක් අදහස් කෙරේදැයි .......... 5

**3. අවම ප්‍රමිතීන් පිළිබඳ සංකල්පය .......... 7**

3.1 ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථානයක අවම ප්‍රමිතීන් සහ අවශ්‍යතාමූලික භෞතික පහසුකම් සහ සේවා .......... 7

3.2 අධ්‍යාපනික සහ මනෝ සමාජයීය පරිසරය .......... 9

3.3 පරිපාලන ප්‍රමිතීන් .......... 11

3.4 ආගමික ප්‍රමිතීන් .......... 12

3.5 විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා සේවා .......... 12

3.6 කාර්ය මණ්ඩලය .......... 12

**4. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා දෙමාපිය සහභාගිත්වය .......... 12**

4.1 අරමුණු සහ අපේක්ෂා .......... 13

4.2 ළමා සංවර්ධන මධ්‍යස්ථානයට සක්‍රීය දායකත්වය ලබාදීම සඳහා දෙමාපියන් දැනගත යුතු දෑ .......... 13

**5. මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන පාලිකා පුහුණුව සඳහා සුදුසුකම් සහ පුහුණු ප්‍රමිතීන් .......... 16**

5.1 ළමා සංවර්ධන මධ්‍යස්ථාන පාලිකාවන් වශයෙන් පුහුණුවීම සඳහා සුදුසුකම් සහ පුහුණු ප්‍රමිතීන් පහත දැක්වෙන සේ විය යුතුය .......... 16

5.2 වෘත්තීය පුහුණු පාඨමාලාවක මූලික සැලැස්ම .......... 16

**6. ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ සංකල්පය .......... 17**

6.1 වයස අවුරුදු 2 සිට 5 දක්වා වර්ධන හා සංවර්ධන රටා සහ වර්ධන කඩඉම් .......... 17

6.2 ආපදා වලට ගොදුරු විය හැකි දරුවන් කල්තියා හඳුනාගැනීමේ වැදගත්කම. .......... 17

6.3 මුල්ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ දරුවන්ගේ වර්ධනය හා පෝෂණ තත්ත්ව ගැන පරීක්ෂාවේ වැදගත්කම .......... 17

6.4 ළමුන් ඇති දැඩි කිරීමේ ක්‍රම පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම .......... 17

6.5 මනෝචාලක, ප්‍රජානන, භාෂාමය, මනෝසමාජයීය, සෞන්දර්යාත්මක ආදී සියළු අංශයන්ගෙන් උපරිම සංවර්ධනයට දායක වන පරිදි වයසට උචිත ඉගෙනුම් අත්දැකීම් සංවිධානය .......... 17

6.6 මුල්ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අවම ප්‍රමිතින් .......... 18

6.7 සංවර්ධන මධ්‍යස්ථාන කළමණාකරණය .......... 18

**7. ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍යතා .......... 19**

7.1 භෞතික පරිසර සහ පහසුකම් ........ 19

7.2 සෞඛ්‍ය සහ පෝෂණ සේවා ........ 20

7.3 ඉගෙනුම් හා මනෝ සමාජීය පරිසරය ........ 20

7.4 කළමනාකරණ අවශ්‍යතා ........ 21

7.5 ආගමික පරිසරය ........ 21

7.6 කාර්ය මණ්ඩල අවශ්‍යතා ........ 22

7.7 දෙමාපිය සහ පරිපාලන සහාය ........ 22

7.8 වැඩ සැලැස්ම ........ 22

# 1. හැඳින්වීම

දරුවකුගේ ජීවිතයේ මුල් පස් වසර මොළයේ වර්ධනය සඳහා ඉතාමත්ම තීරණාත්මක අවධියයි. එම කාල සීමාව තිරණාත්මක වන්නේ මොළයේ වර්ධන වේගය මුල් පස් වසර තුළ ඉතාමත් සිඝ්‍රවීම නිසා පමණක් නොව, එම කාලය දරුවාගේ බුද්ධිමය ක්‍රියාකාරිත්වයෙන් ගුණාත්මක බව තීරණය කරන බාහිර අත්දැකීම් වලට වඩාත්ම සංවේදී අවධියද වන බැවිනි. මීට අමතරව වයස අවුරුදු 3 සහ 5 අතර කාලය, භාෂා සංවර්ධනය, සමාජානුයෝජනය සහ පෞරුෂය ගොඩ නැගීම ආදිය හා සම්බන්ධ ඉතා වැදගත් සංවර්ධන කඩඉම් රාශියක් දරුවා විසින් ලඟා කර ගන්නා අවධියක් වීම නිසාද එය සුවිශේෂී වෙයි. උපතේදී මිනිස් මොළය, සෙසු පද්ධතින්ට සාපේක්ෂව නොමේරූ තත්වයක පවති. මොළයේ කොටස් අතරද, මතකය, ඉගෙනුම, මාංශ පේශින්ගේ ස්වයං ක්‍රියාකාරිත්වය සහ වෙනත් බුද්ධිමය ක්‍රියා පාලනය කෙරෙන මස්තිෂ්කය (cerebral cortex) වඩාත්ම නොමේරූ කොටස වේ. දරුවාගේ මොළය ක්‍රියාත්මක කරමින් සෛල අතර තන්තු- (Synapses) හෙවත් ගමන් මාර්ග (Pathways) ගොඩනැගෙන්නේ දරුවා ලබන අත්දැකීම් ඇසුරෙනි. වයස අවුරුදු 3 සහ 5 අතර කාලය තුළ ගුණාත්මක බවෙන් යුත් උත්තේජක සහ අත්දැකීම් ප්‍රමාණවත්ව ලැබීමෙන් ඊට අදාළ ගමන් මාර්ගය හෙවත් ක්‍රියාමාර්ග ප්‍රසාරණය වීම, ශක්තිමත් වීම හා ස්ථාවර වීම සිදුවේ. මෙසේ ගොඩනැගෙන සම්බන්ධතා අතරින් ප්‍රමාණවත් ලෙස උත්තේජනය නොවන සහ භාවිතා නොකරණ සම්බන්ධතා ක්‍රමයෙන් ක්ෂය වී යයි. එම නිසා මෙම වියේදී සාරවත් පරිසරයක නොවැඩෙන දරුවකු විධිමත් පාසලක යොමු වන අවස්ථාවේ දී, දිගුකාලීන අධ්‍යාපනයකට කෙසේ වෙතත් පාසල් ඉගෙනුමට පවා නිසි සුදානමක් නොමැති, සම්පත් අහිමිවූ තත්වයක ලක්ෂණ පෙන්නුම් කරයි.

මුල් ළමා වියට අදාළ සංවර්ධන කාර්යයන් ලඟා කර ගැනීමේ සාර්ථකත්වය ඊට 'ශක්තිය සපයන පරිසරයක්' මත රඳා පවතී. ආරක්ෂිත වූ සෞඛ්‍ය සම්පන්න වට පිටාව, සෞඛ්‍ය හා සනිපාරක්ෂ පහසුකම්, අනුබල, සැපයෙන දයාන්විත අන්තර් ක්‍රියාකාරීත්වය, සුදුසු ආකෘතින්, ආරක්ෂාව සහ පෝෂ්‍යදායී ආහාර සැපයීම එවැනි පරිසරයක අන්තර්ගත වේ.

පෙර පාසලක් මගින් ලබා දිය යුතු යැයි අපේක්ෂා කරන්නේත්, එමගින් සැපයිය යුතු වන්නේත් මෙම ශක්ති ජනක පරිසරයයි. ඊට දරුවාගේ සංවර්ධන අවධියට සරිලන ලෙස සැපයෙන ගුණාත්මක සත්කාරය සහ පුද්ගලික විවිධතාවන්ට ගරු කරමින් දරුවන්ගේ අවශ්‍යතා ඇමතීම, හෙවත් ඉලක්ක කර ගැනීම අයත් වේ.

පසුගිය දශක දෙක තුල ශ්‍රී ලංකාවේ පෙර පාසල් සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වී ඇත. එහෙත් පෙර පාසල් පැවැත්වීමට අදාළ ජාතික ප්‍රතිපත්තියක් ,2004 වසරේදී රජයෙන් අනුමත වී ඇතත්පෙර පාසල් පිහිටුවීමෙහි නිරතව සිටින සංවිධාන/පුද්ගලයින් බහුල වීම, ප්‍රාථමික පාසලට සුදානම් කිරීම සඳහා දරුවාට කියවීම, ලිවීම, ගණිතය හුරු කිරීම පෙර පාසලේ කාර්යභාරය වේ යැයි යන සාවද්‍ය මතය ආදිය හේතුවෙන් ආකෘතිමය වශයෙන් සහ සැපයෙන සේවා සහ ඉගෙනුම් අත්දැකීම් වල ගුණාත්මක භාවය අතින්, පෙර පාසල් අතර පවතින විවිධත්වයසහ පරතරයඅදත් දක්නට ලැබේ.

මෙම තත්ත්වයට ප්‍රතිකර්ම යෙදීමේ ප්‍රථම පියවර වශයෙන් යුනිසෙෆ් ආයතනය සහ ළමා ලේකම් කාර්යාලය ඒකාබද්ධව දීප ව්‍යාප්ත පෙර පාසල් සමීක්ෂණයක් 2013 වසරේදී සිදු කරන ලදි. එහි සමස්ත අරමුණ වූයේ පෙර පාසල් තුළින් සැපයෙන ළමා සත්කාර සේවා වල ආකාරය සහ එම සේවාවන් හි ගුණාත්මක භාවය තක්සේරු කිරිම විය. පෙර පාසල් පද්ධතියෙහි දක්නට ඇති ඌණතා රාශියක් සහ වැඩි දියුණු කළ යුතු හා පාලනය කළ යුතු අංශ ගණනාවක් ගැන තොරතුරු එම සමීක්ෂණය මගින් හෙළිවී තිබේ.

පහත දැක්වෙන්නේ එම තොරතුරු සමහරකි. එමගින් අපේ පෙර පාසල් සම්බන්ධ වත්මන් තත්ත්වය ඔබට හොඳින් වටහා ගත හැක.

- විවිධාකාරයේ ගොඩනැගිලි වල පෙර පාසල් පවත්වන අතර ඉන් වැඩි සංඛ්‍යාවක් පෙර පාසල් පැවැත්වීම සඳහා නුසුදුසු වේ.
- එළිමහන් හා ගෘහස්ථ ක්‍රීඩා හා ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා යෝග්‍ය උපකරණවලද, තනි තනිව සහ කණ්ඩායම් වශයෙන් දරුවන්ට උත්තේජන සැපයීම සඳහා අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩවල ද හිඟකම ඉතා තදින් කැපී පෙණින.

- වර්ධනයට සහ සංවර්ධනයට අදාළ සේවා අතරින් දැනට සැපයෙන සේවා සංඛාව සහ එම සේවාවන්ගේ

  ගුණාත්මක බව ප්‍රමාණවත් නොවීම. (මෙම සේවාවන්ට මන්දපෝෂණයෙන් පෙළෙන ළමුන් සහ විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා සැපයෙන සේවා අයත් වේ.)

- දරුවාගේ දවසේ වැඩ කටයුතු සංවිධානය කෙරෙන ආකාරය බොහෝ විට විධිමත් නොවීය.

- අභිමත ප්‍රතිඵල ඉලක්ක කර ගනිමින් වයසට සරිලන ලෙස සැපයෙන උත්තේජනවල විශාල අඩුවක් විය.

- ළමුන් ඉගෙන ගන්නා ආකාරය පිළිබඳව පෙර පාසලගුරුවරුන් තුළ වූ දැනුම පහත් මට්ටමක පැවතිණ.

- බොහෝගුරුවරු ස්වභාවික පරිසරය ඵලදායී ලෙස යොදා නොගත්හ.

- පෙර පාසල් අධ්‍යාපනයේ ප්‍රතිලාභ පිළිබඳ දෙමාපියන් තුළ පවත්නා දුර්මත රාශියක් ද මෙම සමීක්ෂණය මඟින් හෙළිදරව් කෙරිණ. සමීක්ෂණයට භාජනය වූ දෙමාපියන් වැඩිදෙනා දරුවන් පෙර පාසලට යැවීමෙන් බලාපොරොත්තු වුයේ හොඳ අධ්‍යාපනයකි. නැතහොත් විධිමත් පාසලට සුදානම් කිරීමකි. පුහුණු කිරීමකි. සමහර දෙමාපියෝ තම දරුවන් පෙර පාසලකට යැවීමේ අවශ්‍යතාව පිළිනොගත්හ. නියැදියට අයත් පෙර පාසල් තුළ වයස අවුරුදු හතරකට අඩු ළමුන් ඉතා සුළු සංඛ්‍යාවක් සිටිමෙන් ද පැහැදිලි වූයේ විධිමත් පාසලට ඇතුල්වීමට පෙර මාස කීපයක් වැනි කෙටි කලකට දරුවා පෙර පාසලට යැවීම ප්‍රමාණවත් යැයි බොහෝ දෙමාපියන් සිතූ බවයි.

- පහත දැක්වෙන දෑ ක්‍රමවත් කිරිම් වස් සැලසුම් ගත මැදිහත්වීමක අවශ්‍යතාවය මෙම සමීක්ෂණ තොරතුරු මඟින් හෙළි වී ඇත.

- අක්‍රමික ලෙස පෙර පාසල් ව්‍යාප්ත වීම සීමා කිරීම.

- ගුණාත්මක වු සත්කාරක සේවා ප්‍රමාණවත් ලෙස සැපයීම සහතික කිරීම.

- පෙර පාසල්ගුරු පුහුණු පාඨමාලාවල ගුණාත්මක බව හා ප්‍රමිතීන් රැක ගැනීම.

- දරුවන්ගේ සංවර්ධනාත්මක අවශ්‍යතා පිළිබඳව දෙමාපියන්ගේ දැනුවත් භාවය වර්ධනය කිරීම.

- පෙර පාසල් සංවිධානය සහ කළමනාකරණය සඳහා දෙමාපිය සහයෝගය සහ සහභාගීත්වය ලබා ගැනීම.

ඉහත කාර්යයන් ඉටු කර ගැනීම එතරම් අපහසු නොවනු ඇතැයි සිතීමට තුඩු දෙන සුභවාදි සාක්ෂිද සමීක්ෂණ වාර්තාවේ අඩංගු වේ. නියැදියට අයත් වු පෙර පාසල්ගුරුවරුන් වැඩි දෙනා තමා ලබන සුළු වේතන ගැන නොතකා, දැඩි පෙළඹීමකින් හා කැපවීමකින් යුතුව සිය වෘත්තියෙහි නියැලී සිටින බවත් ඔවුහු ඉන් තෘප්තියක් ලබන බවත් සමීක්ෂණ දත්ත පෙන්වා දෙයි. මෙමගුරුවරුන් අතරින් 63.3% ක්, අවුරුදු පහට වැඩි කාලයක් ~~කැපවී~~ එම සේවයෙහි නිරතවී සිටීම ඔවුන්ගේ කැපවීම ගැන සාක්ෂි දරයි. සමහර පාලිකාවන්ගේ සේවා කාලය අවුරුදු දහය ඉක්මවා ඇති බවද සඳහන් වේ. එසේම මෙමගුරුවරු සියලු දෙනාම වැඩිදුර වෘත්තීය පුහුණුව අපේක්ෂා කිරීමෙන් ද ඔවුන්ගේ කැපවීම පෙන්නුම් කරති. දෙමාපියන්ගේ ලබාගත් තොරතුරු අනුවද පෙනී යන්නේ ඔවුහු තම තමන්ගේ දරුවන් අයත් පෙර පාසල්වලට සහාය දක්වන බව හා ඔවුන්ගෙන් බලාපොරොත්තු වන කවර සේවාවක් වුවද ලබාදීමට කැමැත්තෙන් පසුවන බව වේ.

එබැවින්, පෙර පාසල, ඉන් බලාපොරොත්තු වන කාර්යභාරය හරියාකාර ඉටුකරන ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කරගැනීම සඳහා ඔබට අවශ්‍ය මග පෙන්වීම ලබාදීම මෙම ප්‍රයත්නයේ අරමුණ වේ.

මෙහි ඉදිරිපත් කරන උපදෙස් හා ප්‍රමිතීන්, 2006 වසරේදී මුල්වරට කරන ලද දීර්ඝවූත්, පුළුල්වූත්, සාකච්ඡාමය ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. පෙර පාසල්ගුරුවරුන්,ගුරුවරුන් සඳහා පුහුණුව සපයන්නන්, පෙර පාසල් පිහිටුවන්නන්, පාලකයින්, පර්යේෂකයින්, විශ්වවිද්‍යාල සම්පත්ධාරීන්, උපදේශකයින්, මධ්‍යම රජය සහ සියළුම පළාත් සභාවන්, රාජ්‍ය නොවන සංවිධාන, ඇතුළු පෙර පාසල් හා සම්බන්ධ විවිධ තල නියෝජනය වනසේ තෝරාගත් පිරිසක් එම සාකච්ඡා සදහා සහභාගි වූ අතර,

ළමා ලේකම් කාර්යාලය සහ යුනිසෙෆ් ආයතනය විසින් මෙම ප්‍රමිතීන් සකස් කිරීමේ කාර්යය මෙහෙයවන ලදී.

මෙම උපදෙස් සහ ප්‍රමිතීන් ඉදිරිපත් කිරීමේ අපේක්ෂාව, පෙර පාසල්, '' ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථාන'' බවට පරිවර්තනය කරගැනීමට ඔබට සහාය වීමයි. වයස අවුරුදු 2 1/2 සහ 5 අතර වයසේ ළමුන් සඳහා වැඩසටහන් සකස් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී අත්‍යවශ්‍ය වන අංශ එකිනෙක ආවරණය වන පරිදි එම උපදෙස් ඉදිරිපත් කර ඇත.

# 2. ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථානඅදාළ සංකල්ප සහ මූල ධර්ම

## 2.1 හැඳින්වීම

මෙහි ඉදිරිපත් කරන සංකල්පමය විග්‍රහය මුල් ළමාවිය සංවර්ධනය සඳහා අවශ්‍ය සත්කාරය හා ඉගෙනුම් අත්දැකීම් කෙසේ මෙහෙයවිය යුතුද යන්නට අදාළ මූලධර්ම මතුකර දක්වයි. එම මූලධර්ම සහ ඊට අනුරූපව ඉදිරිපත් වන අරමුණු හා අපේක්ෂා ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථාන වැඩසටහනක අඩංගු වියයුතු විවිධාංග, එනම් භෞතික සම්පත්, වැඩසටහන් අන්තර්ගතය, ක්‍රමවේදය, ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ, ඉගෙනුම් අත්දැකීම් සංවිධානය, සැපයිය යුතු සේවා, උචිත මනෝ සමාජීයීය පරිසරය, කළමනාකරණය, ගුරු දෙගුරු සම්බන්ධතා, දෙමාපිය සහාය, පාලිකාගුරු පුහුණුව ආදී එකිනෙක කෙසේ සංවිධානය විය යුතුද යන්නට මග පෙන්වයි.

## 2.2 ''සංවර්ධන ක්‍රියාවලියේ'' මූලික ලක්ෂණ

- ළමා සංවර්ධනය යනු චලනය, සිතීම, දැනීම, සහ අන්‍යයන් හා සම්බන්ධය යනාදිය වඩ වඩා සංකීර්ණ මට්ටමින් මෙහෙයවීමට දරුවා තුළ හැකියාව ඇති කරවමින් සිදුවන ක්‍රමික වෙනස්වීමේ ක්‍රියාවලියකි.
- සංවර්ධන ක්‍රියාවලිය වර්ධනය, පරිනතිය, සහ ඉගෙනුම යන ක්‍රියාවලීන්ගේ සංකලනයකි.
- ළමා සංවර්ධනය
    - අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය තුළින් සිදුවේ.
    - අඛණ්ඩව සිදුවේ.
    - ක්‍රමවත් රටාවක් ඇතත් සුවිශේෂය.
    - බහු මානීය වේ, මෙවත් අංශ කිහිපයකින් යුක්තය.
- ශාරීරික, මනෝ චාලක, ප්‍රජානන, භාෂාමය, චිත්තවේගී සහ සමාජය යන ආදි විවිධ සංවර්ධනාංශ අතර අන්‍යෝන්‍ය සම්බන්ධයක්, අන්‍යෝන්‍ය බලපෑමක් සහ අන්‍යෝන්‍ය යැපීමක් පවති.
- මේ නිසා, සංවර්ධන මධ්‍යස්ථානය, සත්කාරය සහ ඉගෙනුම යන අංශ 2කම කෙරෙහි අවධානය යොදමින් සමස්ථ සහ සමොධානික පිවිසුමක් අනුගමනය කළ යුතුය.
- මනාසේ වර්ධනය වෙමින් පරිනත බවට පත්ව, දැනුම සපයා ගැනිමට සහ එම දැනුම විවිධ මාධ්‍ය තුලින් ප්‍රකාශ කිරිම හැකිවන සේ, ක්‍රමයෙන් සංකීර්ණ වන කුසලතා පිළිබඳ දක්ෂතාවය වර්ධනය කර ගැනීමට අත්‍යාවශ ආරක්ෂිත පරිසරයක් සංවර්ධන මධ්‍යස්ථානයක් මඟින් සහතික කළ යුතුය.
- මූලික වශයෙන් ශාරීරික වෙනස දැක්වෙන, වැඩිවශයෙන්ම ජන්ම දායාදය මඟින් තිරණය වන, වර්ධනය, නොවෙනස් වන අදියර කිහිපයක් ඔස්සේ සිදු වේ.
- පරිසර බලපෑම් වලට යටත් වුවද වැඩි වශයෙන්ම ජන්ම දායදය මඟින් තිරණය වන පරිනතිය චර්යාවේ ක්‍රමික වෙනසකට හේතු වේ.
- පහසුව සඳහා විවිධ වර්ධන අංශ ගැන අපි වෙන් වෙන්ම සඳහන් කරමු. එහෙත්සංවර්ධනය සමස්ථ ක්‍රියාවලියකි. විවිධ වර්ධනාංශ අතර අන්තර් ක්‍රියා හා අන්තර් බලපෑම් පවතී. උදාහරණ ලෙස ගත හොත් මන්ද පෝෂණය, ශාරීරික වර්ධනය පමණක් නොව ප්‍රජනන සංවර්ධනය සහ මනෝ සමාජයීය සංවර්ධනය කෙරෙහිද බලපෑම් ඇති කරයි.
- යම් කිසි අවස්ථාවක, දරුවාගේ ඉගෙනුම් ක්‍රියාවලියේ ස්වභාවය, වැඩි වශයෙන්ම ඔහු/ඇය ලබා ඇති වර්ධන හා පරිනත මට්ටම් මඟින් තිරණය කෙරේ. මෙයින් පෙන්නුම් කරන්නේ දරුවා සූදානමක් නොදක්වන ඉගෙනුම්, ඉගැන්වීම්, ක්‍රමෝපාය අනුගමනය කිරීමෙන් සංවර්ධනය ඇති කළ නොහැකි බවයි.
- සංවර්ධනය සමස්ථ ක්‍රියාවලියක් බැවින් ළමයාගේ පූර්ණ සංවර්ධනය ගැන සළකා, සෑම සංවර්ධනාංශයක්ම අවධානයකට ලක්විය යුතුය.නිවැරදි ආරම්භයට

මේ සඳහා අවශ්‍ය සමෝධානික පිවිසුම, ක්‍රමෝපායන් දෙකක සංකලනයෙන් සකස් කර ගත හැක.

1. ඉගෙනුම අවස්ථා ඉදිරිපත් කිරීමේදී සමෝධානික ප්‍රවේශය අනුගමන කළ යුතු වේ.
2. ඉගෙනුම් පරිසරය, සත්කාරය හා ඉගෙනුම යන අංශ 2කම ඒකාබද්ධව සැපයෙන්නක් විය යුතුය.

සත්කාරය ගැන සලකන විට, ඉක්මනින් වර්ධනය හා සංවර්ධනය සඳහා තීරණාත්මක වන්නේ, දරුවන් රැක බලාගන්නන් විසින් ඔවුන්ගේ කාලය සහ සම්පත්, දයාන්විත හැඟීම් සහ අවධානයෙන් යුතුව, වර්ධනය සහ සංවර්ධනය දිරිගැන්වීමට යොදා ගන්නා ආකාරයයි.

සරල බසින් දක්වන්නේ නම් දරුවාට පෝෂ්‍යදායී ආහාර වේලක් ලැබීම, එන්නත් ඇතුළු වෛද්‍ය සත්කාර ලැබීම, පරිහරණයට නිසි සනිපාරක්ෂක පහසුකම් සහ පිරිසිදු පානිය ජලය ලැබීම, ආරක්ෂිත පරිසරයක් තුළ ආදරය දක්වන, ප්‍රතිචාරාත්මක වැඩිහිටියන් සමග අන්තර් ක්‍රියාවට සහ උත්තේජනය සඳහා ඉඩප්‍රස්ථා සැපයීම වේ.

**2.3 ''ළමා මිතුරු වීම'' යන්නෙන් කුමක් අදහස් කෙරේදැයි**

පහත දැක්වෙන ලක්ෂණ වලින් යුත් පරිසරයක් සැපයීම ඉන් අදහස් කෙරේ.

- සත්කාරය ස්ථිරව, අඛණ්ඩව ලැබෙන බවට විශ්වාසය තැබිය හැකි පරිසරයක්.
- උණුසුම්, දයාන්විත, ආදර බර උත්තේජනාන්විත පරිසරයක්.
- දරුවන්ගේ විභවතාවන්ට සහ දුර්ලවතාවන්ට සංවේදීව, ඊට සරිලන සේ සකස් කළ පරිසරයක්.
- දරුවන්ගේ විභවතා උපරිම ලෙස සංවර්ධනය වීමට සහ පූර්ණ ආරක්ෂිත හැඟීමකට තුඩුදෙන්නා වූ පරිසරයක්.
- ළමා අවධියට අවේනික ක්‍රියාකාරකම්, උදාහරණ වශයෙන් ක්‍රීඩාව, නිරීක්ෂණය, ගවේෂණය, විමසීම, තැත් වරද ඉගෙනීම, අනුකරණය ආදිය ඉගෙනුම් අත්දැකීම් සැපයීමේ ක්‍රමෝපාය වශයෙන් උපයෝගී කරගැනීමකි.
- ක්‍රමයෙන් මුහුකුරා යන චින්තන රටා හා කායික හා මනෝ සමාජයීය කුසලතා යොදා ගැනෙන, ඒවා අභියෝගයට ලක්කරමින් ප්‍රසාරනය
- කෙරෙන(Stretch) ආකාරයේ ක්‍රියාකාරකම් වලට ළමයා යොමු කිරීමකි.
- ළමුන් ලැදියා දක්වන ක්‍රියාකාරම්හි තනි තනිව හෝ සහයෝගීව, කණ්ඩායම් වතාවරණයක් තුළ නිරත වීමට අවශ්‍ය ආරක්ෂාව, මග පෙන්වීම සහ උත්තේජනය සැපයීමකි.
- සුරක්ෂිත සහ පිරිසිදු වට පිටාවකින් යුක්ත වීමට අවශ්‍ය පහත දැක්වෙන අවම ප්‍රමිතින්ට අනුකූල වන සේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය සකස් විය යුතුය.
    - ළමයින්ගේ ක්‍රියාකාරකම් සඳහා ආරක්ෂිත බිමක් සහ ගොඩනැගිල්ලක්
    - අවශ්‍ය ප්‍රමාණයට පිරිසිදු පානීය ජලය.
    - අවශ්‍ය ප්‍රමාණයට සනීපාරක්ෂක පහසුකම්.
    - වාතාශ්‍රය හොඳින් ඇති කාමර.
    - අනතුරු වලට ලක්විය හැකි ස්ථාන වල සිට ආරක්ෂිත දුරකින් පිහිටා තිබීම.
    - ප්‍රමාණවත් ලෙස ආරක්ෂාව සපයන පිරිසිදු වට පිටාවක්.
- සංවර්ධන මධ්‍යස්ථානයක් මගින් දරුවන්ගේ පහත දැක්වෙන සමස්ත සංවර්ධන අවශ්‍යතා නිසිසේ සැපිරිය යුතුය
    - වෛද්‍ය සේවා
    - ස්වස්ථතාව සහ සනීපාරක්ෂාව
    - සමාජානුයෝජනය
    - පෝෂණ අවශ්‍යතා
    - ගුණධර්ම ගොඩ නැගීම
    - විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සම්බන්ධව ප්‍රතිචාරාත්මක වැඩසටහන

- දෙමාපියන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහ මැදිහත්වීම ළමා සංවර්ධන මධ්‍යස්ථානයට ලැබිය යුතුය. ඔවුහු සංවර්ධන මධ්‍යස්ථානය පවත්වා ගැනීමට හා කළමනාකරණයට දායක විය යුතුය

මෙම විග්‍රහය ළමා මිතුරු පරිසරයක මූලික ලක්ෂණ පෙන්නුම් කරනු පමණක් නොව, ඉගෙනුම් අත්දැකීම් සැපයීමේදී අනුගමනය කළ යුතු ක්‍රම වේදය ගැනද අදහස් ඉදිරිපත් කරයි. ඉගෙනුම් ක්‍රියාවලියේ කේන්ද්‍රස්ථානය දරුවා විය යුතුය.

දරුවගේ ස්වභාවය සහ ස්වීයත්වය සමග මනා ගැලපීමක් නොවේ නම් කවර උපකරණයකින් හෝ ඉගැන්වීමකින් හෝ වෙනත් කිසිවකින් අභිමත ප්‍රතිඵල නොලැබේ. අපේ පෙර පාසල්වල සාමාන්‍යයෙන් සිදුවන්නේ, කියවීම, ලිවීම, ගණිතය හා වෙනත් ළමුන්ට නීරස ක්‍රියාකාරකම් හි ඔවුන් නිරත කරවීම වේ. දෙමාපියන්ගේ හා ගුරුවරුන් වැඩි දෙනෙකුගේ කැමැත්තද එය විය හැකිය.

## 3. අවම ප්‍රමිතීන් පිළිබඳ සංකල්පය

අවම ප්‍රමිතීන් සහ අවශ්‍යතා පිළිබඳ සංකල්පය අවුරුදු 3 ත් 5 ත් අතර වයසේ දරුවන්ගේ සමස්ත සංවර්ධන අවශ්‍යතා සුපරාලීමට ප්‍රමාණවත් සේවා සැපයීම සහතික කෙරෙන මට්ටමකට සංවර්ධන මධ්‍යස්ථානයක විවිධ අංග නංවාලීම සඳහා ගන්නා ලද ඒකාබද්ධ සංවිධාත්මක ප්‍රයත්නයක් පිළිබිඹු කරයි. අවම ප්‍රමිතීන් අනුගමය කිරීම, සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම ක්‍රමානුකූල බවට පත්කිරීමටත් දැනට පවතින පෙර පාසල් ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථාන බවට පරිවර්තනය කරගැනීමටත්, ඒවායේ ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීමටත් ආධාර වන අතර ඇගයීම සහ අධීක්ෂණය පහසු කරවයි.

### 3.1 ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථානයක අවම ප්‍රමිතීන් සහ අවශ්‍යතාමූලික භෞතික පහසුකම් සහ සේවා

ක්‍රීඩාව, නිරීක්ෂණය, ගවේෂණය සහ පංති කාමර තුළ හා ඉන් පිටත කෙරෙන වෙනත් ක්‍රියාකාරකම් පෙර පාසල් වයසේ දරුවන්ට ආවේණික ඉගෙනීම් ක්‍රමෝපාය වේ. එබැවින් සංවර්ධන මධ්‍යස්ථාන ආරක්ෂිත සහ පිරිසිදු විය යුතුය. ඉඩකඩ සහිත විය යුතුය.

**<u>I.පිහිටීම හා භෞතික පරිසරය</u>**

- ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවන භූමි භාගය කඳුකර බෑවුම් සහිත ප්‍රදේශයන්හි හෝ මත්පැන් ශාලා හෝ අලෙවි සැල්, සිනමාහල්, වීඩියෝ දර්ශන ශාලා හෝ අලෙවිසැල්, අවමංගල ශාලා, සතිපොළ, බස් නැවතුම් පොළ, මස් මාංශ වෙළෙඳසැල්, කර්මාන්ත ශාලා, ගරාජ හෝ අපද්‍රව්‍ය බහාලන ස්ථාන ආදියට යාබදව හෝ සමීපවහෝ නොවිය යුතුය.
- සාමාන්‍යයෙන් එය අධික ශබ්ද ඝෝෂාකාරයට, අනතුරුදායක තත්ත්වයන්ට හා වායු දූෂණයට ලක් නොවන, එමෙන් පහසුවෙන් ලඟා විය හැකිපරිසරයක ස්ථානගත විය යුතුය.
- විසකුරු සතුන්ට ගැවසිය හැකි ලඳු කැලෑ නොමැති හොඳින් පිරිසිදු කළ ගෙමිදුල මටසිලුටු භූමියක් විය යුතුය.
- නාගරික, අර්ධ නාගරික හෝ ග්‍රාමීය ආදි සියළු තැන්හි භූමිය වටා තාප්පයක් හෝ වැටක් හෝ තිබිය යුතු අතර ප්‍රධාන ගේට්ටුව ආරක්ෂා සහිත විය යුතුය.
- භූමිය විවෘත ළිං, පොකුණු, ඇළ දොළ, ගංගා, වැව් හෝ බෑවුම් ආදියට ආසන්න නොවිය යුතුය.
- ගොඩනැගිල්ලේ ප්‍රධාන දොරටුව, ප්‍රධාන පාරට මුහුණලා හෝ ඊට ආසන්නව සකස් නොවිය යුතුය.
- විවිධ වර්ණයේ මල් ගස්, එළවලු, පලතුරු, ඖෂධ පැලසහ සෙවන දෙන ගස්වලින් භූමිය අලංකාර විය යුතුය.
- වැලි, වතුර සමඟ ක්‍රීඩා කිරීම සඳහා සහ ඔංචිල්ලා ආදි එළිමහන් ක්‍රීඩා උපකරණ සඳහා ප්‍රමාණවත් ඉඩ කඩ ගෙමිදුලෙහි තිබිය යුතුය.
- දේශීය අමුද්‍රව්‍යවලින් සකස් කරන ලද ක්‍රීඩා උපකරණ තිබීම යෝග්‍යය.
- විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා පිවිසීමේ පහසුකම් තිබිය යුතුය.

**<u>II.ගොඩනැගිලි</u>**

- ගොඩනැගිලි දරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂාවට හිතකර වියයුතුය.
- පොළෙව සහ වහලය කල් පවතින ලෙස ද, ගොඩනැගිල්ල ශකක්තිමත්වද සකස් විය යුතු අතර ඒවායේ ශක්තිමත් භාවය ගැන විටින් විට පරීක්ෂාකාරී විය යුතුය. (පොල් අතු, තල් අතු ආදීදේශයට ගැලපෙන ද්‍රව්‍ය පියස්ස සඳහා යොදා ගත හැකිය.)

- දරුවන් සඳහා ඉගෙනුම් සහ ක්‍රීඩා ක්‍රියාකාරකම් කිරීම සඳහා ගොඩනැගිල්ල ප්‍රමාණවත් ඉඩ කඩකින් යුක්ත විය යුතුය. එක් දරුවකු සඳහා අවම වශයෙන් වර්ග අඩි 20 ඉඩකඩ විය යුතුය.
- වාතාශ්‍රය, ආලෝකය ගොඩනැගිල්ල තුළට හොඳින් ලැබිය යුතු වනඅතර වැසි හිරිකඩ, තද සුළං තද හිරු එළිය සෘජුවම පන්ති කාමර තුළට ගලා නො ආ යුතුය. (ආවරණය සඳහා ප්‍රදේශයෙන් ලබා ගත හැකි පැලලි වැනි දෑ යොදා ගත හැකිය.)
- ගොඩනැගිල්ලේ මුළු බිත්ති ප්‍රමාණයෙන් 1/7 වන සේ දොර ජනෙල් තිබිය යුතුය.
- ගොඩනැගිල්ල කොට බිත්ති වලින් යුක්ත වේ නම් බිත්තිය අවම වශයෙන් බිම සිට මීටර් 1 උස් විය යුතු- අතර, වැසි සුළං සහ තද හිරු එළියෙන් ආවරණය සඳහා පැලලි යොදා ගත යුතුය.
- ළමා චිත්‍ර ආදි නිමැවුම් ප්‍රදර්ශනය සඳහා ප්‍රමාණවත් බිත්ති ප්‍රමාණයක් තිබිය යුතුය.
- දරුවන්ගේ වාර්තා, ක්‍රීඩා උපකරණ සහ වෙනත් ආරක්ෂා කළ යුතු දෑ සඳහා ගබඩා කාමරයක් හෝ වෙනත් පහසු කම් තිබිය යුතුය.
- ආහාර පිළියෙල කිරීම සඳහා කුඩා මුළුතැන් ගෙයක් තිබියයුතුය.
- රෝගී තත්ත්වයක සිටින දරුවෙකු හෝ විවේකය අවශ්‍ය දරුවකු සඳහා වෙන් කළ ස්ථානයක් තිබිය යුතුය.
- ආකර්ෂණීය වන ලෙස බිත්ති වර්ණවත්ව ආලේප කළ යුතුය.
- ගුරුවරුයාට පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි වන සේ ඇතුළත ආවරණ හෝ බෙදීම් අවම විය යුතුය.

## <u>III.</u> ලී බඩු සහ උපකරණ

මූලික අවශ්‍යතා

- සැහැල්ලු ලීයෙන් විශේෂයෙන් ළමා මේස සහ පුටු සෑදිය යුතුය(මිනුම් මෙසේ විය යුතුය)
  - මේසයෙහි උස : බිම සිට අඩි 2යි
  - පුටුවේ උස : ආසනය දක්වා උස අඩි 1යි
  - පුටු ඇන්ද : ආසනයේ සිට උස අඩි 1යි
  - ආසනයේ ප්‍රමාණය : වර්ග අඩි 1යි
- නිදහසේ භාවිතය සඳහා ළමුන්ගේ උසින් බිත්ති කළු ලෑල්ලක්
- ගුරුවරුන් සඳහා මේස -පුටු
- කළාල, පැදුරු, බුමුතුරුණු ප්‍රමාණවත් ලෙස
- ළමුන්ගේ චිත්‍ර ආදි නිමැවුම් ප්‍රදර්ශනය කළ හැකි පුවරු
- ක්‍රීඩා භාණ්ඩ තැබීම සඳහා ළමුන්ගේ උසින් රාක්ක සහ කුඩා අල්මාරි
- දැන්වීම් පුවරුවක්
- අනතුරුදායක නොවන අභ්‍යන්තර සහ එළිමහන් ක්‍රීඩා උපකරණ, ළමා පොත්, කැබලි රූප, සංගීත භාණ්ඩ, ඉවත ලන සුන්බුන් හා භාණ්ඩ සඳහා පෙට්ටියක්
- කෝප්ප, පිඟන්, ජෝගු, කෑම පිසීම සහ ජලය රැස්කර තැබීම සඳහා භාජන ආදිය සහ ඒවා තැබීමට සුදුසු ස්ථානයක්.
- දරුවන්ගේ වතුර බොතල් එල්ලා තැබීමට සුදුසු උසකින් සවිකළ ආධාරකයක්.
- කුඩා මුස්න, ඉදල්, පාපිසි, කුණු බාල්දි (ළමුන්ට පරිහරණය කළ හැකි ප්‍රමාණයේ) සහ අත් පිස්නා.
- විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ ස්නභාවය අනුව ඔවුන්ට භාවිත කළ හැකි ක්‍රීඩා උපකරණ.

**IV.ජල පහසුකම් සහ සනිපාරක්‍ෂක පහසුකම්**

- පානීය ජලය ලබා ගැනීම සඳහා ආරක්ෂිත ළිඳක් හෝ ජල නළ පහසුව සහ බීම සඳහා උණුකළ ජලය රැස්කර තැබීමට භාජන
- දරුවන්ට ගැලපෙන සේ සකස් කළ ජල මුද්‍රිත වැසිකිළි / කැසිකිළි (ළමුන් 15- 20 අතර සංඛ්‍යාවට එකක් වන සේ) හා ඊට අදාළ ජල පහසුව. (නල ජලය නොමැති නම් ජලය රැස්කර තැබීමට ප්‍රමාණවත් භාජන සහ අත් සේදීමට සබන්)
- කෑමට පෙර සහ පසු අත් සේදීමට සහ එළිමහන් ක්‍රීඩා ආදියට පසු අත් පා සේදීමට ජලය සහ සබන්.
- ඉවතලන කඩදාසි ආදිය දැමීමට කුණු කුඩයක් සහ මධ්‍යස්ථානයේ කසල ඉවත් කිරීමට විධිමත් ක්‍රමයක්
- විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා යෝග්‍ය ජල පහසුකම් සහ සනීපාරක්‍ෂක පහසුකම්

**V.සෞඛ්‍ය හා පෝෂණ අවශ්‍යතා**

- ළමුන් සඳහා අර්ධ වාර්ෂිකව සෞඛ්‍ය සායනයක් සහ දෙමාපියන් දැනුවත් කිරිමේ සැසියක් පැවැත්විය යුතුය.
- පවුල් සෞඛ්‍ය සේවිකාවන් හා එක්ව ළමුන් පිළිබඳව සෞඛ්‍ය වාර්තා පවත්වා ගත යුතුය.
- අවප්‍රමාණ වර්ධනය දක්වන ළමුන් කෙරෙහි දෙමාපිය අවධානය යොමු කර අවශ්‍ය තැන්හි වෛද්‍ය උපදෙස් සඳහා යොමු කළ යුතුය.
- නිවසෙන් රැගෙන එන හෝ මධ්‍යස්ථානයෙහි සකස් කළ හෝ මාරුවෙන් මාරුවට දෙමව්පියන් විසින් සපයන හෝ පෝෂ්‍යදායී ආහාර වේලක් ළමුන්ට දීමට දෙමාපිය සහභාගිත්වයෙන් සැලසුම් කළ යුතුය.
- යහපත් ගති පැවතුම්, පුරුදු, පෝෂ්‍යදායී ආහාර පිළිබඳ දැනුම ආදිය ඉස්මතු වනසේ ආහාර ගැනීමට සැලැස්විය යුතුය. එම කටයුතු සංවිධානය ස්ථිර ලෙස, පුද්ගලයෙකු හෝ කමිටුවක් වෙත හෝ පැවරිය යුතුය.
- ප්‍රථමාධාර ලබාදීම, සුලභ රෝග ලක්ෂණ හඳුනාගැනීම, වෛද්‍ය උපදෙස් සඳහා යොමු කිරීම ආදිය පිළිබඳ පුහුණුවක් ගුරුවරයා ලබා තිබිය යුතුය.
- සෑම ළමයෙකු තුළම මනා සෞඛ්‍ය පුරුදු ඇති කළ යුතුය .
- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (DDHS) සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) සමග මධ්‍යස්ථානය සම්බන්ධ විය යුතු අතර, මධ්‍යස්ථානයේ ළමුන් කිසිවෙකුට වැළදෙන බෝවෙන රෝග පිළිබඳව වහා ඔවුන්ට දැනුම් දිය යුතුය.
- ප්‍රථමාධාර පෙට්ටියක් තිබිය යුතුය.

### 3.2 අධ්‍යාපනික සහ මනෝ සමාජයීය පරිසරය

සංවර්ධන මධ්‍යස්ථානය තුළ ලබන ඉගෙනුම සිදුවිය යුත්තේ එක් එක් දරුවාගේ හැකියාවන්ට අනුව, ප්‍රවේසම් සහිත මග පෙන්වීමකින් යුතුව සහ ස්වාධීනත්වය ආත්ම විශ්වාසය සහ ආරම්භක ශක්තිය වර්ධනය කෙරෙන ආකාරයට වේ. ඒ මක් නිසාද යත් මේ වියේදී ළමුන් ප්‍රජානන, මනෝ චාලක සහ භාෂාමය කුසලතා අතින් සීඝ්‍ර වර්ධනයක් ලබන අතර, සමාජ ගති පැවතුම්, සදාචාරමය හැසිරීම් සහ පෞරුෂ ලක්ෂණ සම්බන්ධ චර්යා සමූහයද සීඝ්‍රයෙන් විකසිත කරගැනීමෙහි යෙදෙන බැවිනි.

#### *3.2.1 ඉගෙනුම් පරිසරය/ මූලික අවශ්‍යතා*

- පරිසර අවධානය, ගවේශන, නිරීක්ෂණ හැකියා, වැස්ස, අව්ව, සුළඟ ආදී ස්වභාවික දේශගුණික තත්ත්ව පිළිබඳ දැනුම ආදිය වර්ධනය වන සේ අත්දැකීම් ලබාදීම සඳහා ආරක්ෂිතව යොදා ගත හැකි ඉඩ කඩ, (මධ්‍යස්ථාන භූමිය තුළ හෝ ඊට ආසන්නව)
- තනිතනිව හා සාමූහිකව ක්‍රීඩා කළ හැකි ආරක්ෂිත ගෙවත්ත.

- පහතින් විහිදි ගිය අතුපතර ඇති ගස්, නැගීමට බැසීමට පස් කණ්ඩියක්, පැද්දීමට ලිස්සා යෑමට ගස් අතර බැඳි කඹයක්, වැලි, වතුර සෙල්ලම් සහ මැටි ඇණීම සඳහා ස්ථාන ආදිය උදාහරණ වශයෙන් දැක්විය හැකි, එළිමහන් ක්‍රීඩා සඳහා උපකරණ සහිත සෙල්ලම් මිදුලක්.
- නිර්මාණශීලීත්වය, නම්‍යශීලීත්වය, අනුවර්තන හැකියා හා වැඩෙන කුසලතා හා නැවුම් බව මතු- කෙරෙන, එසේ තර්කානුකූල සිතීම් ආදී බුද්ධිමය කුසලතා ක්‍රියාත්මක කරන අත්දැකීම් ලබා ගැනීමට ප්‍රමාණවත් ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ.
- වැලි සහ වතුර සමග සෙල්ලම් සඳහා විවිධ හැඩ සහ පරිමා සහිත බඳුන්.
- සුවිශේෂ සංකල්ප සහ කුසලතා ගොඩනැගීමට ආධාර වන - ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ. උදා : ප්‍රහේලිකා කට්ටල, පිටු පෙරලන, රූප සහිත කාඩ්පත් ආදිය.
- ළමුන්ට චරිත රංගන සඳහා යොදා ගත හැකි විවිධ වර්ගයේ/ප්‍රමාණයේ වර්ණවත් ඇඳුම් සහ කණ්ණාඩියක් සහිත රංගන කවයක්.
- සෙල්ලම් ගෙය, පරිසර මුල්ල, පොත් මුල්ල, සෞන්දර්යය මුල්ල ආදි වෙනත් ඉගෙනුම් කව.
- ළමුන් ක්‍රීඩාවෙහි යෙදෙන ස්ථාන ගුරුවරියන්ගේ බැල්මට පහසුවෙන් හසුවන සේ සකස් වීම

### *3.2.2 මනෝ සමාජයීය පරිසරය*

- සංවර්ධන මධ්‍යස්ථානයේ සමස්ත පරිසරය තුළින් ප්‍රීතිමත් භාවය, ආදරය, ආරක්ෂාව, පිළිගැනිම සහ නිදහස ආදිය, ක්‍රියාත්මක වීම සඳහා දරුවාට අවශ්‍ය තත්ත්වයන් අත්දැකීමට සැලැස්වේ.
- උදෑසන පැමිණීම, විසිර යාම ආදි අවස්ථාවලදී දෙමාපියන් හා දරුවන් ආචාරශීලීව අමතා, සුදුසු ලෙස පිළිසඳරෙහි යෙදේ.
- වේවැලක් ප්‍රදර්ශනය කිරීම, උස් හඬින් අණ දීම හෝ නිහඬතාවය අපෙක්ෂා කිරීමෙන් ඇති කළ හැකි තර්ජනයෙන්, මධ්‍යස්ථාන වාතාවරණය සම්පූර්ණයෙන් නිදහස් වේ.
- අවශ්‍යතා, ළැදියා සහ චර්යා අතින් දරුවන් අතර ඇති පෞද්ගලික විවිධතා පිළිගැනීමට හා සැලකීමට පාත්‍ර කෙරේ.
- සිය කැමැත්තට අනුව තොරා ගන්නා ක්‍රියාකාරකම්හි නිරත වීමට දරුවන්ට නිදහස සහ අවස්ථා සපයයි.
- තරමක උත්සාහයකින් අනතුරුව සාර්ථකව නිම කළ හැකි ක්‍රියාකාරම් දරුවන්ට සපයා, ඉන් ලබන ප්‍රීතිය භුක්තිවිඳීමට සලස්වයි.
- අත්පා සෝදා ගැනීම, ඇඳුම් ඇඳගැනීම, පාවහන් පැලද ගැනීම වැනි සරල දෑ අන්‍යයන් ලවා කරවා ගැනීමට බලාපොරොත්තු තබා නොගෙන, තම තමා විසින්ම කැමැත්තෙන්, විනෝදයෙන් හා සාඩම්බරයෙන් කරගැනීමට සලස්වා, යැපීමේ තත්ත්වයෙන් මිදීමට දරුවන්ට උදව් කරයි.
- සිය දක්ෂතා ප්‍රකාශනයට සහ වර්ධනය කර ගැනීමට දරුවන්ට උදව් දේ.
- ළමයකු විසින් නිම කරන කාර්යය අගය කිරීමෙන්, දිරිමත් කිරීමෙන් හා සමූහයේ පිළිගැනීමට පාත්‍ර කිරීමෙන් දරුවා තුළ ආත්ම විශ්වාසය ආත්ම ගරුත්වය සහ සමත්බව පිළිබඳ හැගීම් ගොඩ නගයි.
- විනය පවත්වා ගැනීමේදී විවේචනය සහ දඬුවමින් වැලකී උපායශීලීව දරුවා වරදින් මග හරවා, නිවැරදි චර්යාව වෙත යොමු කරයි.
- දරුවාට ප්‍රියමනාප ක්‍රියාකාරකම්හි, පෙළඹවීමකින් යුක්තව යෙදීම තුළින් මතු වන ස්වයං විනය දිරිමත් කරයි.
- එක්ව ක්‍රියාකිරීමට, එකිනෙකාට උදව් කිරීමට, සම්පත් බෙදාහදා ගැනීමට සහ අන්‍යයන්ගේ අදහස් සහ අවශ්‍යතාවන්ට ගරු කිරීමට අවස්ථා බහුල ලෙස සපයයි.
- එකිනෙකාට සුහද ලෙස ඇමතීමට, අදහස් ප්‍රකාශ කිරීමට සහ සුහද කතා බහේ යෙදීමට ළමුන් දිරි ගන්වයි.

- සිය පෝෂණ අවශ්‍යතා සපුරා ගැනීමට අමතරව, ආහාර ගැනීමේදී අනුගමනය කළ යුතු යහ පුරුදු, සිරිත් විරිත් හා සුහද අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩනැගෙන පරිදි ආහාර ගැනීමේ යෙදීමට ළමුන්ට උදව් සැපයේ.
- පිරිසිදුකම, පිළිවෙළ සහ ආරක්ෂාව ගැන සැලකිලිමත්වීමේ අවශ්‍යතාව මතුවන පරිදි දෛනික කටයුතුවල යෙදීමට දරුවන්ට මග පෙන්වයි.
- සාමූහික වගකීම, මධ්‍යස්ථානයට අයත් බව සහ එහි අභිවෘද්ධියට තමා දායකවේය යන හැඟීම් දරුවන් තුළ ගොඩ නගා ගැනීමට ඔවුන්ට උපකාරිවේ.
- ගුරුවරුළමුන්ගේ ආරක්ෂාව සහ සුභසෙත ගැන නිතර විමසිලිමත් වෙති.
- ළමුන් හෝ දෙමාපියන් ඉදිරියේ ළමුන් සන්සන්දනය කිරීමෙන් ගුරුවරු සම්පූර්ණයෙන් වැලකී සිටිති.
- ගුරුවරු එක් එක් ළමයා ලබන ප්‍රගතිය ඇගයීමෙහි, අගය කිරීමෙහි හා දිරිමත් කිරීමෙහි යෙදෙති.
- ආහාර පිළියෙල කිරීම, බෙදීම ආදී දිනපතා කටයුතුවල දී සහාය සැපයීමට දෙමාපියන්ට ඉඩ සැලසීමෙන් සුහද සමූහ වාතාවරණයක් ගොඩ නඟයි.
- අවට වෙසෙන සුවිශේෂ දක්ෂතා ඇති පුද්ගලයින් මුණගැසීමට සහ ඔවුන් ගේ දක්ෂතා ප්‍රදර්ශනයට මධ්‍යස්ථානයේ පවත්වන උත්සව යොදා ගනී.
- ප්‍රදේශයේ සම්පත්, එහි බහුලව සිදු කෙරෙන කර්මාන්ත සහ අවට සුවිශේෂ ස්ථාන නැරඹීමට ළමුන් රැගෙන යති.

### 3.3 පරිපාලන ප්‍රමිතීන්

පරිපාලන ප්‍රමිතීන් මගින් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකරණය කෙතරම් ක්‍රමානුකූලව සහ කාර්යක්ෂමව කෙරේදැයි තීරණය කෙරේ. ප්‍රතිඵලදායී ලෙස සේවා සැපයීම සඳහා විවිධ වර්ගයේ වාර්තා සහ ලේඛන පවත්වා ගත යුතුවා සේම, ආගමික සහ සංස්කෘතික අත්දැකීම් සංවිධානයට පහසුකම් සැපයීමද අවශ්‍ය වේ.

**ලේඛන**(පහත දැක්වෙන ලේඛන පවත්වාගැනීම සහ ආරක්ෂිතව තබා ගැනීම අවශ්‍යය)

- දරුවන් ඇතුළත් කර ගැනීමේ ලේඛනය.
- දරුවන්, ගුරුවරුන් සහ දෙමව්පියන් රැස්වීම් සඳහා පැමිණීමේ ලේඛන.
- දරුවන්ගේ සෞඛ්‍ය වාර්තා.
- හදිසි අවස්ථාවකදී දැනුම් දීම සඳහා භාරකරුවන්ගේ දුරකථන අංක / ලිපිනය.
- දරුවන්ගේ ප්‍රගති වාර්තා සහ කුසලතා සංවර්ධන වාර්තා.
- ලොග් පොත.
- මූල්‍යමය වාර්තා.
- ගුරුවරුන්ගේ පෞද්ගලික ලිපි ගොනු.
- දෙමව්පියන්ට තොරතුරු සැපයීමට සහ අදහස් විමසීමට දැන්වීම් පුවරුවක්.
- ළමා සංවර්ධනය පිළිබඳ තොරතුරු දෙමව්පියන් හා බෙදාහදා ගැනීමට ප්‍රදර්ශන පුවරුවක්.
- දෙමව්පියන්ට දිය හැකි දායකත්වය හා වෙනත් ප්‍රජා අදහස් තැන්පත් කිරීමට කුඩා පෙට්ටියක්
- පෙර පාසලෙහි කළමනාකරණ මණ්ඩලයක් සිටිය යුතුය. එම මණ්ඩලය නිරතුරුව රැස්වීම් පැවැත්විය යුතුය.
- මාසිකව පවත්වන දෙමව්පිය රැස්වීම් වාර්තා.

- අදහස් හා යෝජනා ලියා ඇතුළ්කිරීම සඳහා කුඩා පෙට්ටියක් තිබීම.
- දරුවන් සම්බන්ධ සේවා සපයන නිලධාරීන්ගේ විස්තර ඇතුළත් ලේඛනයන් ප්‍රදර්ශනය කිරීම

### 3.4 ආගමික ප්‍රමිතීන්

- ආගම ඇදහීම දෙමාපිය අනුමැතිය අනුව විය යුතුය.
- ආගමික වතාවත් සඳහා සුදුසු ස්ථානයක් තිබිය යුතුය.
- විශේෂ ආගමික දින උත්සවාකාරයෙන් සැමරිය යුතුය.

### 3.5 විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා සේවා

- මන්දපෝෂණය හෝ විශේෂ ආබාධ හෝ දුර්වලතාහෝ ඇති ළමුන් හඳුනාගත හැකි වන සේ ළමුන් සඳහා වෛද්‍ය පරීක්ෂණයක් / සායනයක් (වාර්ෂිකව/අර්ධ වර්ෂිකව) පැවැත්විය යුතුය.

### 3.6 කාර්ය මණ්ඩලය

- සෑමළමුන් 20 ක් සඳහාම එක් පුහුණු ගුරුවරයෙකු සිටිය යුතුය. ගුරුවරුන් අඩු තරමේ වසරකට වරක් සේවාස්ථ පුහුණුවක් ලැබිය යුතුය.
- ආහාර සකස් කිරීම සහ භූමිය සහ වැසිකිළි ආදිය පිරිසිදු කිරීම භාරව කටයුතු කිරීමට සහායකයින් සිටිය යුතුය.
- ගුරුවරුන්ගේ ශුභ සිද්ධිය පිණිස වැඩ පිළිවෙළක් තිබිය යුතුය.

## 4. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා දෙමාපිය සහභාගිත්වය

## 4.1 අරමුණු සහ අපේක්ෂා

- මුල්ළමාවිය රැකවරණය හා සංවර්ධනයේ ඇති වැදගත්කම පිළිබඳව දෙමාපියන් තුළ වඩා හොඳ අවබෝධයක් ඇති කිරීම.
- ළමා සංවර්ධනයේදී දෙමාපියන්ගේ කාර්යභාරය කෙරෙහි අභිමානය ඇති කරමින් ළමුන් ඇති දැඩි කිරීමේ කුසලතා වර්ධනය කිරීම සහ ළමා සංවර්ධන ක්‍රියාවලියට සක්‍රීව දායකවීමට දෙමාපියන් පෙළඹවීම.
- දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා සංවර්ධන මධ්‍යස්ථානවලින් ලැබෙන දායකත්වයේ වැදගත්කම පිළිබඳ අවබෝධය හා සංවර්ධන මධ්‍යස්ථාන සැලසුම් කිරීම, පවත්වා ගෙනයාම, පිළිබඳ වගකීම බෙදා ගැනීමේ අවශ්‍යතාවය දෙමාපියන් හා ප්‍රජාව තුළ ඇති කිරීම.

## 4.2 ළමා සංවර්ධන මධ්‍යස්ථානයට සක්‍රීය දායකත්වය ලබාදීම සඳහා දෙමාපියන් දැනගත යුතු දෑ

### *4.2.1 ළමයාගේ වැඩීම හා සංවර්ධන ක්‍රියාවලිය තේරුම් ගැනීම*

- පැවැත්ම, වැඩීම හා සංවර්ධනය පිළිබඳ ළමා අයිතිවාසිකම්.
- පිළිසිඳ ගැනීමේ සිට වයස අවු. 5 දක්වා කාලයේ වැදගත් කම.
- සංවර්ධන ක්‍රියාවලියේ සමස්ත ස්වාභාවය.
- පෝෂණය, සෞඛ්‍ය සම්පන්න බව හා සනිපාරක්ෂාවේ වැදගත්කම.
- මුලසිට ලැබෙන උත්තේජනය හා මොළයේ වර්ධනය සහ බුද්ධියේ ගුණාත්මක භාවය කෙරෙහි එය බලපාන ආකාරය.
- ක්‍රියාකාරකම් හා ක්‍රීඩා මඟින් ළමුන් ඉගෙන ගන්නා ආකාරය.
- ක්‍රියාශිලිවීම සඳහා දරුවාට ආරක්ෂිත පරිසරයක් තුළ නොමසුරු ආදරය, පිළිගැනිම, සත්කාරය හා නිදහස අවශ්‍ය බව.
- ශාරීරික, චිත්තවේගික හා සමාජයමය වශයෙන් දරුවා හොදින් වර්ධනය වීම සඳහා ආදරය හා සත්කාරය සපයන ප්‍රතිචාරාත්මක වැඩිහිටියන් (දෙමාපියන්) සමග විශ්වාසනීයසම්බන්ධකමක් ඇති කර ගැනීම අත්‍යවශ්‍ය බව.
- සම වයස් ළමුන් සමග පවත්වන සමූහ සම්බන්ධතා හා සමූහ ක්‍රීඩා මගින් සමාජ හුරුවක් ලබා ගැනිමේ අවස්ථාව දරුවාට අවශ්‍ය බව.
- ආත්ම ගරුත්වය, ආත්ම විශ්වාසය හා සමත් බව පිළිබඳ හැඟීම් වර්ධනය කර ගැනීම දරුවාට අවශ්‍ය බව.
- යම් විශේෂ ආකාරයකට සිතීමේ පුරුද්ද ළමුන් තුළ ආරෝපණය කිරීමෙන් විවෘත මනසකින් ලෝකය දෙස බැලීම වලක්වාලන බව.

### *4.2.2 ළමුන් හා ළමා සංවර්ධනය පිළිබඳ දෙමාපියන් දරන දුර්මත.*

- දරුවාගේ භෞතික හා සමාජ පරිසරය ළමා සංවර්ධනය පිළිබඳ එතරම් වැදගත් නොවේය යන හැඟීම.
- මුල් වසර කීපය තුළදී අවශ්‍ය වන්නේ ශාරීරික සංවර්ධනය ගැන ප්‍රමාණවත් ලෙස සැලකීම පමණක්ය යන විශ්වාසය.
- ළමයා සංවර්ධනය වන ආකාරය ඔහුගේ/ඇයගේ ජාන හෙවත් ආරය මත තීරණය වනු මිස ඔවුන් වැඩෙන පරිසරය ඒ සඳහා වැදගත් නොවේය යන මතය.
- දරුවා හැසිරවීම හා හැඩගැස්වීම දැඩි නීති රීති හා දඬුවම් මගින් කළ හැකිය යන විශ්වාසය.
- දරුවාට සමච්චල් කිරීම, අපහාස කිරීම දරුවාගේ මානසික සංවර්ධනයට හානිදායක බව වටහා නොගෙන එය ළමුන් හැසිරවීමේ උපායක් ලෙස යොදා ගැනීම.

- සෑම දෙමාපියෙක්ම ළමුන් නිසි ආකාර ඇති දැඩි කිරීමට දන්නේය යන විශ්වාසය හා සිය දෙමාපියන් තමා ඇති දැඩි කිරීමේදී යොදා ගත් ක්‍රම එසේම අනුගමය කිරීම.
- දරුවාට ආදරය සහ පිළිගැනීම පෙන්නුම් කිරීම නුසුදුසු යැයි දරණ මතය සහ උවමනාවෙන්ම එය ලබා නොදීම.
- සංවර්ධන මධ්‍යස්ථානයකටළමයා යැවීමේ වැදගත්කම වටහා නොගෙන දරුවා එවැනි මධ්‍යස්ථානයකට නොයැවීම.
- විවිධාකාරයේ ආබාධයන්ගෙන් පෙළන දරුවන් කෙරෙහි ඇතිසෘනාත්මක ආකල්ප හේතුවෙන්, උපරිම සංවර්ධනයට ඔවුන්ට ඇති අවස්ථා අහිමි කිරීම.
- විධිමත් පාසලට ඇතුල් කිරිමට පෙර සුළු කාලයකට පමණක් දරුවා සංවර්ධන මධ්‍යස්ථානයකට යැවීම ප්‍රමාණවත්ය යන විශ්වාසය.
- මුල්ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේදී දරුවාට කියවීම, ලිවීම, ගණිතය ඉගැන්විය යුතු යන මතයේ සිටීම.

### 4.2.3 *ළමා වර්ධනය සහ සංවර්ධනය පිළිබඳව පවුල් පරිසරයට හිමි වැදගත්කම*

- ළමයාගේ වැඩීම හා සංවර්ධනය මනාව සිදු වන්නේ ඊට හිතකර පරිසරයක් තුළ පමණි.
- ළමයා තුළ සුරක්ෂිත බව/ආරක්ෂාව පිළිබඳ හැඟීම් ඇතිවීමට සමගි සම්පන්න පවුල් පරිසරයක් අවශ්‍යය.
- පවුලේ අඩදබර, බිමත්කම සහ, මව ගෙන් වෙන්වීම ආදිය දරුවා තුළ අනාරක්ෂිත ගැඟීම් ඇති කරයි.
- දරුවාගේ ශාරීරික අවශ්‍යතා ගැන පමණක් සැලකීම ප්‍රමාණවත් නොවේ. දරුවාට ආදරය, උණුසුම, පිළිගැනීම නොඅඩුව ලැබීම අත්‍යාවශ්‍ය වන අතර ළමයාගේ සමස්ත සංවර්ධනය දිරිගන්වන උත්තේජන ප්‍රමාණවත් ලෙස සැපයෙන අත්දැකීම් නිවස තුළින් හා අවට පරිසරයෙන් ලබා දිය යුතුය.
- වෙනත් කිසිම ස්ථානයකදී නොකළ හැකි පරිදි, දරුවාට ආදරය හා ලෙන්ගතුකම දනවන පරිසරයක් තුළ, තනි තනි දරුවා සමඟ අන්තර් ක්‍රියාවට හා දරුවා වෙනුවෙන් කාලය ගත කිරීමට දෙමපියන්ට හා වෙනත් වැඩිහිටියන්ට නිවසේදී අවකාශ ලබා ගත හැක.
- දරුවගේ මනෝ සමාජයීය සංවර්ධනය දිරිගැන්වෙන පරිදි, දරුවා පිළිගැනීමට හා සැලකීමට භාජනය කිරීමටත්, දරුවාගේ සමත්කම් පිළිබඳව එක්ව ප්‍රීති වීමටත් දෙමාපියන්ට නොමද අවස්ථා සපයා ගත හැක.
- නොසලකා හැරිම ආදි සියළු ආකාරයේ ළමා අපයෝජන හා ශාරීරික දඬුවම් වලින් දරුවා ආරක්ෂා කිරීම සඳහා දෙමාපියන් පෙරමුණ ගත යුතු අතර, බාහිර උපද්‍රව හා අපයෝජන වලින් ආරක්ෂා කර ගැනීමද ඔවුන් සතු කාර්යයකි.

### 4.2.4 *මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන කටයුතු සඳහා දෙමාපිය සහභාගීත්වයට ඇති ඉඩ ප්‍රස්තා*

- භෞතික පහසුකම් සැපයීම සහ නඩත්තුව.
- එළිමහන් ක්‍රීඩා භූමියක් / සෙල්ලම් මිදුලක් සකස් කිරීමට / පවත්වා ගැනීමට උදව් කිරීම හා ප්‍රදේශයට ආවේණික, මිළ අඩුව සකසා ගත හැකි ක්‍රීඩා උපකරණ සැපයීම.
- පාසල් භූමිය නඩත්තුව, ළමුන්ගේ ඩෙස්ක්, පුටු හා පංති කාමර බිත්ති පිරිසිදු කිරීම, තීන්ත ගෑම ආදිය සඳහා ශ්‍රමදාන ව්‍යාපාර පැවැත්වීම.
- දරුවන්ට පෝෂ්‍යදායී ආහාර වේලක් සැපයීමට සහභාගිවීම.
- සංවර්ධන මධ්‍යස්ථානයේ කටයුතු සහ ළමුන්ගේ ප්‍රගතිය ආදිය පිළිබඳ සාකච්ඡා කිරීමටත්, තීරණ ගැනීම, සැලසුම් සකස් කිරීම, මෙහෙයවීම හා අගැයීම ආදිය පිළිබඳ දෙමාපියන් බලගැන්වීම් සඳහා දැනුවත් කිරීමේ සැසි පැවැත්වීමටත්, සැලසුමක් අනුව රැස්වන ගුරු දෙගුරු සංගමයේ පිහිටුවීම.

- එක් එක් සංවර්ධන මධ්‍යස්ථානය සඳහා ප්‍රදේශයේ ප්‍රභූන් හා දෙමාපියන්ගෙන් සැදුම්ලත් ''මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධන කමිටුක්'' පිහිටුවීම.

- පෝෂණ වැඩසටහන් පැවැත්වීමට, උපදේශක සේවා ලබා ගැනීමට, විශේෂ උපකාර අවශ්‍ය ලෙස හඳුනාගත් ළමුන්ගේ අවශ්‍යතා ගැන කටයුතු කිරීමට පවුල් සෞඛ්‍ය සේවක මහත්මීන් හා මධ්‍යස්ථාන පාලිකාව හා එක්ව ක්‍රියා කිරීම.

- සංවර්ධන මධ්‍යස්ථානයේ පාලනයට සහායවීම.

- සංවර්ධන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් වටා ගොඩ නැගෙන පුද්ගලාන්තර සම්බන්ධතා සහ පවුල් අතර සහයෝගය තුළින් තම දරුවන් ඇති දැඩිවන පරිසරයේ ගුණාත්මක බව වර්ධනයට උදවුවන සමාජ රැකවරණ ජාලයක් ගොඩ නඟා ගැනීමට ක්‍රියා කිරීම.

### *4.2.5 දෙමාපිය සහභාගීත්වය ලබා ගැනීමේ ක්‍රම සහ විධි*

- කුඩා කණ්ඩායම් සහ විශාල කණ්ඩායම් වශයෙන් ඔවුන්ට පහසු, අවස්ථාවල දෙමාපියන් මුණ ගැසීම. (සම්පූර්ණ කණ්ඩායම් මුණ ගැසෙන අවස්ථාවලදී පැමිණීම අනිවාර්ය කරන්න.)

- හමුවන අවස්ථාවලදී, පාලිකාව සමග හා දෙමාපියන් එකිනෙකා සමග අදහස් හුවමාරු කර ගැනීම පහසු කරවන සේ විධිමත් සහ අවධිමත් සාකච්ඡා සඳහා ඉඩ සැලසීම.

- තමාගේ දරුවාට අගනාම ඉගැනුම් අවස්ථා සැපයීය හැකි බවට පාලිකාව කෙරෙහි විශ්වාසය ගොඩ නැගෙනසේ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.

- සෑම දෙමාපියෙකුටම මධ්‍යස්ථානයේ අභිවෘද්ධියට දායකවිය හැකි බවත් එම දායකත්වය සුළු හෝ වේවා වැදගත් බවත් ඒත්තු ගැන්වීම.

- දෙමාපියන් දැනුවත් කිරීම සඳහා යොදා ගන්නා භාෂාව සහ අනිකුත් සන්නිවේදන මාධ්‍ය සියළු දෙනාට පහසුවෙන් අවබෝධ කරගත හැකි සේ සරල මට්ටමකින් පවත්වා ගැනීම සහ එමගින් ඉතා පැහැදිලි ලෙස පණිවුඩ ඉදිරිපත් කිරීම.

- ළමුන්ගේ ප්‍රගතිය ගැන දෙමාපියන් දැනුවත් කිරීම.

- දරුවාගේ සමස්ත සංවර්ධනයට උපරිම ලෙස උත්තේජන සැපයෙන ආකාරයටත්, දරුවාට ආදරය, පිළිගැනීම සහ නිදහස දනවන වාතාවරණයක් සහතික කරමින් දරුවා සමඟ ගත කිරීමට කාලය සැපයෙන අන්දමටත් සිය නිවසේ කටයුතු සංවිධානය කර ගන්නා ආකාරය ගැන දෙමාපියන් දැනුවත් කිරීම.

- දෙමාපියන් සහභාගි කර ගනිමින්, ආගමික උත්සව සහ සුහද හමු මධ්‍යස්ථානයේ පැවැත්වීම හා දෙමාපියන්ද කැටුව කෙටි චාරිකා සංවිධානය.

- දෙමාපියන්ට සිය අදහස් ප්‍රකාශ කිරීමට උපක්‍රම සැලසීම (පණිවිඩ බහාලන පෙට්ටියක්) හා ඉදිරි වැඩසටහන් ගැන දෙමාපියන් දැනුවත් කිරීමට හා ඔවුන්ට වැදගත් පණිවුඩ/දැනුම ලබාදීමට (දැන්වීම් පුවරුවක් මගින්) උනන්දු වීම.

- එක් එක් දරුවාගේ අවශ්‍යතාවන්ට අනුව, සෑම ළමයකු-ටම තමාට හැකි උපරිම සත්කාරය සහ අවධානය ලබා දීමට තමා පුද්ගලිකව උනන්දුවේය යන්න ගැන දෙමව්පියන් තුල විශ්වාසය ඇති කිරීම.

## 5. මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන පාලිකා පුහුණුව සඳහා සුදුසුකම් සහ පුහුණු ප්‍රමිතීන්

''ගුණාත්මක සත්කාරයෙහි'' වඩාත්ම වැදගත් මූලය හෙවත් ඒකකය, මධ්‍යස්ථාන පාලිකාව වේ. ඇය, ප්‍රබෝධමත්, උණුසුම්, ඇහුම්කන් දෙන, දරුවන්ගේ පුද්ගලික අවශ්‍යතාවන්ට ගරු කරන, දරුවන් පොළඹවන, පුද්ගලික උත්සාහය අගය කරන, දැනුවත් බවෙන් යුත් උපාය දක්ෂ, නිර්මාණශීලී අයෙක් විය යුතු අතර, දරුවන්ගේ සමාජ, චිත්තවේග, මනෝචාලක, සහ ප්‍රජානන සංවර්ධන දිරිගැන්වෙන සේ වර්ධන අවස්ථාවන්ට ගැලපෙන ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට සමත් විය යුතුය. ඊට අමතරව ඇය, සෞඛ්‍ය, පෝෂණය, රෝග වැලැක්වීම, දරුවන්ගේ සංවර්ධනය හා ප්‍රගතිය ඇගයීම, ආබාධිත ළමුන්ට උචිත සත්කාරය සැපයීම සහ දෙමාපිය සහභාගීත්ව වැඩසටහන් සංවිධානය ආදිය හා සම්බන්ධ සේවා සමූහයක් සැලසුම් කිරීමට සමත් විය යුතුය.

### 5.1 ළමා සංවර්ධන මධ්‍යස්ථාන පාලිකාවන් වශයෙන් පුහුණුවීම සඳහා සුදුසුකම් සහ පුහුණු ප්‍රමිතීන් පහත දැක්වෙන සේ විය යුතුය

- සංවර්ධන මධ්‍යස්ථාන පාලිකා පුහුණු සඳහා තෝරා ගැනීමට අවම අධ්‍යාපනික සුදුසුකම අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ සාමාර්ථ හතරක් / තුනක් වේ. උසස් පෙළ අසමත් අය අතරින් පුහුණුව සඳහා තෝරාගන්නේ නම් ඔවුන් සඳහා පවත්වන තේරීම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.
  වයස : පුහුණුව සඳහා තෝරා ගැනීමේදී වයස අවුරුදු 18 ත් 30 ත් අතර විය යුතුය.
  - මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සඳහා වන ජාතික කමිටුව මගින් අනුමත විෂය
  - නිර්දේශයකට අනුව පවත්වන වෘත්තීය පුහුණු පාඨමාලාවක අවම කාලය වසරකට නොඅඩු විය යුතුය. (පැය 300 ක්)
- සෑම පාලිකාවක්ම අඩු තරමේ වසරකට වරක් පැය 50 කට නොඅඩු සතිඅන්ත සේවාස්ථ පුහුණුවක් ලැබිය යුතුය.

### 5.2 වෘත්තීය පුහුණු පාඨමාලාවක මූලික සැලැස්ම

- මුල්ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ දාර්ශනික, ඓතිහාසික හා මනෝවිද්‍යාත්මක පදනම.
- ළමා අයිතිවාසිකම් (ජීවත්වීමට උපරිම වර්ධනය හා සංවර්ධනයට සහ ආරක්ෂාවට ඇති අයිතිය විශේෂයෙන් අවධාරණය කරමින්)
- පිළිසිඳ ගැනීමේ සිට අවු. 5 දක්වා වර්ධනයේ හා සංවර්ධනයේ ස්වභාවය
- වර්ධනය හා සංවර්ධනය
- සමස්ත සංවර්ධනය
- වර්ධනය හා සංවර්ධනය කෙරෙහි බලපාන සාදක
  1. සෞඛ්‍ය, පෝෂණය හා සනීපාරක්ෂාව
  2. පරිසරය, අත්දැකීම් හා ඉගෙනුමේ වැදගත්කම
  3. ප්‍රජානන සංවර්ධනයේදී, උපතේ සිට ලබන උත්තේජනයේ වැදගත්කම
  4. සංවර්ධන ආපදා

## 6. ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ සංකල්පය

**6.1 වයස අවුරුදු 2 සිට 5 දක්වා වර්ධන හා සංවර්ධන රටා සහ වර්ධන කඩඉම්**

- ළමයා, ඉගෙනීමේ යෙදෙන ආකාරය හා ක්‍රීඩාවේ ඇති වැදගත් කම.
- මනෝචාලක සංවර්ධනය
- මනෝ සමාජයීය සංවර්ධනය
- භාෂා සංවර්ධනය
- ප්‍රජානන සංවර්ධනය හා සංකල්ප සාධනය
- පරිසර අවධානය හා සෞන්දර්ය සංවර්ධනය
- සමස්ත පෞර්ෂ සංවර්ධනයට හා යාව ජීව ඉගෙනුමට අවශ්‍ය පදනම් සකස් කිරීම
    1. සංවර්ධන මධ්‍යස්ථාන ඇසුරෙන් යහපුරුදු අගයන් හා ආකල්ප සකස් කිරීම සහ සමාජ සංස්කෘතික හා ආගමික පරිසරයට යොමු වීම.
    2. විධිමත් පාසලට ඇතුල්වන විට දරුවා විසින් ප්‍රගු-ණ කර තිබිය යුතු යැයි බලාපොරොත්තුවන කුසලතා.

**6.2 ආපදා වලට ගොදුරු විය හැකි දරුවන් කල්තියා හඳුනාගැනීමේ වැදගත්කම.**

**6.3 මුල්ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ දරුවන්ගේ වර්ධනය හා පෝෂණ තත්ත්ව ගැන පරීක්ෂාවේ වැදගත්කම.**

- දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්ව නංවාලීමේ හා දිවා සුරැකුම් හා සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්යභාර්ය සෞඛ්‍ය පරීක්ෂණ, සෞඛ්‍ය සේවා සමග සම්බන්ධීකරණය, වාර්ථා තබා ගැනීම.
- සංවර්ධන මධ්‍යස්ථාන තුල පිරිසිදුකම ඉහල මට්ටමක පවත්වා ගැනීමේ හා ප්‍රමාණවත් සෞඛ්‍යාරක්ෂක පහසුකම් සැපයිමේ වැදගත්කම

**6.4 ළමුන් ඇති දැඩි කිරීමේ ක්‍රම පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම**

**6.5 මනෝචාලක, ප්‍රජානන, භාෂාමය, මනෝසමාජයීය, සෞන්දර්යාත්මක ආදි සියළු අංශයන්ගෙන් උපරිම සංවර්ධනයට දායක වන පරිදි වයසට උචිත ඉගෙනුම් අත්දැකීම් සංවිධානය.**

1. නිර්මාණාත්මක හැකියා සංවර්ධනය
2. ක්‍රීඩාව මඟින් ඉගෙනීම.
    - විවිධ ක්‍රීඩා ස්වරූප.
    - එකිනෙකෙහි භාවිතය, වැදගත්කම, ඉගෙනුම් කව.
3. සමෝධානික ඉගෙනුම, තේමා තෝරා ගැනීම සහ සැලසුම් කිරීම.
4. නිරීක්ෂණය, ගවේෂණය සහ ස්වභාවික පරිසරය උපයෝගී කර ගැනීම.
5. පෙර කියවීම, පෙර ලිවීම, පෙර ගණිතය, සවන්දීම ආදි කුසලතා වර්ධනය.
6. ගණිත සංකල්ප ගොඩ නැගීම සදහා ඉගෙනුම් අත්දැකීම්
7. කතාන්දර, රංගනය, රිද්මය, කවි - සිංදු ගායනය හා වාදනය.
8. ක්‍රීඩා භාණ්ඩ / ඉගෙනුම් / ඉගැන්වීම් උපකරණ තැනීම්, තෝරා ගැනීම.
9. සමත්බව, ආත්ම විශ්වාසය ආදිය පිළිබඳ හැඟිම් අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය තුලින් ගොඩ නැගීම

## 6.6 මුල්ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අවම ප්‍රමිතීන්

- ගොඩනැගිල්ල
- ජල හා සනිපාරක්ෂක පහසුකම්
- දිවා ආහාර සැපයීම හා පහසුකම්
- ක්‍රීඩා සඳහා (අභ්‍යන්තර - බාහිර) ඉඩ කඩ
- ලීබඩු හා උපකරණ
- රෝගි අවස්ථාවලදී විවේකිව ගත කිරීමට ස්ථානයක්.
- අධ්‍යාපනික උපකරණ.

## 6.7 සංවර්ධන මධ්‍යස්ථාන කළමණාකරණය

- ළමුන් නිරීක්‍ෂණය, නියාමණය ප්‍රගතිය ඇගයීම හා වාර්ථා තබා ගැනීම
- අදාළ සේවා දායකයින් සමග සම්බන්ධතා පවත්වා ගැනීම
- දෙමාපිය දැනුවත් කිරීම හා දෙමාපිය හා ප්‍රජා සහයෝගය ලබා ගැනීම
- පාලක මණ්ඩලයක්/කමිටුවක් පිහිටුවීම හා සංවර්ධන මධ්‍යස්ථාන මෙහෙය වීම හා ඇගයීම
- සංවර්ධන මධ්‍යස්ථාන පාලිකාවන්ගේ පෞරුෂ වර්ධනය
- ඉංග්‍රීසි භාෂා මුලික නිපුනත්වය
- සම්පත් මධ්‍යස්ථාන/වෙනත් මුල්ළමාවිය මධ්‍යස්ථාන චාරිකා
- ප්‍රදේශයෙන් සපයාගත හැකි හා ඉවත දමන ද්‍රව්‍ය භාවිතා කර ඉගෙනුම්/ඉගැන්වීම් උපකරණ තැනීම පිළිබඳ වැඩමුළු/සමුහ අත්දැකීම්
- මසකට නොඅඩු කාලයක් තුළ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් තුල ලබන ප්‍රායෝගික අත්දැකීම්

## 7. ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍යතා

*කරුණාකර ඔබගේ මධ්‍යස්ථානයට අදාල වන සියළු කරුණු සලකුණු (✓) කරන්න.*

### 7.1 භෞතික පරිසර සහ පහසුකම්

#### *7.1.1 පිහිටීම*

- පහසුවෙන් ළඟා විය හැකිය
- ළමුන්ට ගැවසීමට සහ ඔවුන්ගේ අවධානයට යොමුවීමට අයෝග්‍ය ස්ථාන වලින් බැහැරව පිහිටා තිබේ. ( උදා : මස්, මාළු, මත්පැන් වෙළඳ සැල් ආදිය)
- ළමුන්ට අනතුරුදායක විය හැකි ස්ථානවලින් ප්‍රමාණවත් දුරකින් පිහිටා තිබේ. (උදාඃ- විවෘත ළිං, පොකුණු, බැවුම්)
- සෞඛ්‍යයට හිතකරය

#### *7.1.2 භූමිය*

- භූමිය වටා ආරක්ෂිත වැටක් / තාප්පයක් තිබේ
- ප්‍රධාන දොරටුව හොඳින් ආරක්ෂා කර ඇත
- භූමිය පඳුරු ආදියෙන් තොර, පිරිසිදු භූමියකි
- සෙල්ලම් මිදුල, සෙවන ඇති, මට සිලුටු බිමකි
- ළමුන්ට ආරක්ෂිතව නැගීමට, පැනීමට, රිංගා යෑමට පැද්දීමට සහ සමබර ක්‍රීඩාවන්ට ඉඩකඩසහ ක්‍රීඩා උපකරණ ඇත

#### *7.1.3 ගොඩනැගිල්ල*

- ස්ථිර ගොඩනැගිල්ලකි
- එක් ළමයෙක් සඳහා අවම වශයෙන් අඩි 20 ක ප්‍රමාණයක ඉඩ ඇත
- ප්‍රමාණවත් ආලෝකය සහ වාතාශ්‍රය ඇත (මුළු බිත්ති ප්‍රමාණයෙන් 1/7 ක් වනසේ වාත කවුළු අවම වශයෙන් තිබිය යුතුයි.)
- කොට බිත්ති වල අවම උස පොලව මට්ටමේ සිට මීටර් 1කි.
- විවිධ වර්ණ වලින් බිත්ති ආලේප කර ඇත
- ගොඩනැගිල්ල හොඳින් නඩත්තු කර ඇත
- ගොඩනැගිල්ල සංවර්ධන මධ්‍යස්ථාන ක්‍රියාකාරකම් සඳහා පමණක් උපයෝගී කර ගනී
- ගොඩනැගිල්ල වෙනත් කාර්ය සඳහා භාවිතා කරන නමුදු ළමුන්ගේ ක්‍රීඩා භාණ්ඩ සහ ළමානිමැවුම් ආදියට ඉන් අවහිරයක් නොමැත.

#### *7.1.4 එහි පහත සඳහන් පහසුකම් ඇත.*

- ළමා චිත්‍ර ආදී නිමැවුම් ප්‍රද්ර්ශනය සඳහා ප්‍රමාණවත් බිත්ති ඉඩ /ප්‍රද්ර්ශන පුවරු / රාක්ක
- කාර්යාල කාමරයක්
- බඩු කාමරයක් / භාණ්ඩ තැන්පත් කිරීමට ඉඩ
- මුළුතැන් ගෙයක් /කෑම සකස් කිරීම සඳහා සුදුසු ස්ථානයක්
- රෝගී තත්ත්වයක සිටින දරුවකු සඳහා වෙන්කළ සුරක්ෂිත ස්ථානයක්
- ළමුන්ට සුදුසු ජල මුද්‍රිත, ජල පහසුකම් ඇති වැසිකිළි (ළමුන් 25 දෙනෙකුට එක් වැසිකිළියක් බැගින්)

#### *7.1.5 ලී බඩු උපකරණ සහ පහසුකම්*

- දරුවන්ට උචිත උසින් තැනූ, සැහැල්ලු මේස සහ පුටු ප්‍රමාණවත්ව ඇත
- පාලිකාවන් සඳහා මේස සහ පුටු ඇත
- ලේඛන සඳහා අල්මාරියක් ඇත

- ළමුන්ගේ උසින් බිත්ති කළුලෑල්ලක් ඇත
- පින්තූර පොත් සහ ඒවා ප්‍රදර්ශනයට ස්ථාන ඇත
- පෑදුරු සහ කලාල ඇත
- ළමා නිමැවුම් ප්‍රදර්ශන පහසුකම් ඇත
- කෑම පිසීමට, ආවරණය කරතැබීමට, කෑම බෙදීමට, ජලය රැස්කර තැබීමට අවශ්‍ය උපකරණ ඇත
- බීමට ගන්නා ජලය උණු කිරීමට , රැස්කර තැබිමට පහසුකම් ඇත
- ළමුන්ගේ බෑග් ආදිය එල්ලා තැබීමට ආධාරක ඇත

### *7.1.6 සනීපාරක්ෂක පහසුකම්*

- ළිං / නල ජල පහසුව ඇත
- ජල මුද්‍රිත වැසිකිලි සඳහා අදාල ජල පහසුව ඇත
- බීමට උණු කළ ජලය රැස් කර ඇත
- කෑමට පෙර හා පසු, එළිමහන් ක්‍රීඩා සහ වැසිකිලි භාවිතයෙන් පසුව අත්, පා සේදීමට ජලය සහිත ස්ථානයක් ඇත
- දිනපතා කසල ඉවත් කිරීමට විධිමත් ක්‍රමයක් ඇත

## 7.2 සෞඛ්‍ය සහ පෝෂණ සේවා

- සෑම ළමයකු තුළම මනා සෞඛ්‍ය පුරුදු ඇති කෙරේ
- දරුවන්ගේ පිරිසිදු කම සහ සෞඛ්‍ය තත්ත්වය ගැන දිනපතා විමසිලිමත් වේ
- පෝෂ්‍යදායී ආහාර වේලක් දිනපතා ලබා දේ
- ප්‍රථමාධාර පෙට්ටියක් සහ ඊට අදාල බෙහෙත් ද්‍රව්‍ය ඇත
- ළමුන් පිළිබඳ සෞඛ්‍ය වාර්තා පවත්වා ගනී

## 7.3 ඉගෙනුම් හා මනෝ සමාජීය පරිසරය

### *7.3.1 ඉගෙනුම් පරිසරය*

- පරිසර අවධානය, නිරීක්ෂණ, ගවේශන හැකියා වර්ධනය සඳහා වත්ත/ වටාපිටාව යොදාගනී
- තනි තනිව හා සාමුහිකව ක්‍රීඩා කිරීමට එලිමහනේ ස්ථාන ආරක්ෂිතය
- එලිමහන් ක්‍රීඩා සඳහා ප්‍රමාණවත් උපකරණ ඇත. (උදා : ඔන්චිල්ලා, ලිස්සන පුවරු ආදී)
- වැලි, වතුර සෙල්ලම් සඳහා ඉඩ සලසා ඇත
- වැලි වතුර සෙල්ලම් සඳහා විවිධ ප්‍රමාණ හැඩ සහ පරිමාව ඇති භාජන තිබේ
- නිර්මාණශීලීත්වය, නැවුම් බව, නම්‍යශීලිත්වය, අනුවර්තන හැකියා හා ශාරීරික, මානසිකකුසලතා මතුකෙරෙන පංති කාමර ක්‍රීඩා භාණ්ඩ සහ උපකරණ ඇත.

**පහත සඳහන් ඉගෙනුම් කව ඇත.**

- රංගන කවයක් (සෙල්ලම් ගෙයක්, විවිධ වර්ගයේ , ප්‍රමාණයේ ඇඳුම් සහ කන්නාඩියක් ඇතිව)
- පරිසර මුල්ලක්
- චිත්‍ර කවයක් සහ පොත් මුල්ලක්
- වෙනත් ඉගෙනුම් කව
- විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ට උචිත උත්තේජන සහ ඉගෙනුම් අත්දැකීම් සැපයේ.

### *7.3.2 මනෝ සමාජීයීය පරිසරය*

- උදය පැමිණීම, විසිරියාම ආදී, අවස්ථා දෙමාපියන් හා දරුවන් සමඟ පිළිසඳරට සුදුසු ලෙස යොදා ගනී
- මධ්‍යස්ථානයේ සමස්ත පරිසරය දරුවන් තුළ ප්‍රීතිය සහ පිළිගැනීම පිළිබඳ විශ්වාසය ඇති කරවන සුළුය
- වේවැල ආදිය ප්‍රදර්ශනය කිරීමෙන් ඇති කෙරෙන තර්ජනාත්මක ස්වරූපයෙන් පරිසරයසම්පූර්ණයෙන්ම නිදහස්ය
- දරුවාගේ ප්‍රියමනාපයට සහ හැකියාවන්ට අනුව තෝරා ගන්නා ක්‍රියාකාරකම් හී නිරත වීමඉඩ ලැබේ
- ප්‍රියමනාප කාර්යයන්හි පෙළඹීමෙන් යුක්තව නිරත වීම තුලින් මතුවන ස්වයං විනය දිරිමත්කරයි
- ඇඳුම් ඇඳ ගැනිම පාවහන් පැළඳ ගැනීම ආදී සරල දෑ අනුන් ලවා කරවා නොගෙන, කැමැත්තෙන්, ප්‍රීතියෙන්, අභිමානයෙන් යුතුව තමා විසින්ම කර ගැනීමට සැලැස්වීමෙන්, යැපීමේ තත්ත්වයෙන් මිදීමට ළමුන්ට උදව් කරයි
- ළමා - ළමා, ගුරු - ළමා, දෙමාපිය - ළමා, සංවාදය දිරි ගන්වයි
- එක්ව ක්‍රීඩා කිරීමට, සම්පත් බෙදා ගැනීමට එකිනෙකාට උදව් කිරීමට, අන්‍යෝන්‍ය අදහස් හාඅවශ්‍යතා ගරු කිරීමට ඉඩ සැලසෙන අවස්ථා බහුල ලෙස සපයයි
- සුහදව, ආචාරශීලීව එකිනෙකා ඇමතීම සහ සමාජ ආචාර ධර්ම දිරි ගන්වයි
- ආහාර ගැනීම වැනි එදිනෙදා සිදුවීම් අන්‍යෝන්‍ය සුහදතාවය ගොඩනැගීමට සහ පිරිසිදුකම, පිළිවෙළ, ආරක්ෂාව ආදිය හා සම්බන්ධ යහ පුරුදු, සිරිත් විරිත් අගයයන් හා ආකල්ප මතුවන පරිදි යොදා ගනී
- මධ්‍යස්ථානයට අයත් බව, එය හා අනන්‍යතාවය සහ සාමූහික වගකීම පිළිබඳ හැඟීම් ගොඩනගා ගැනීම දිරි ගන්වයි

### 7.4 කළමනාකරණ අවශ්‍යතා

**පහත සඳහන් ලේඛන ඇත**

- සිසුන් ඇතුලත් කිමේ ලේඛනය
- සිසුන්ගේ පැමිණීමේ ලේඛනය
- ගුරු පැමිණීමේ ලේඛනය
- දෙමාපිය රැස්වීම් සඳහා පැමිණීමේ ලේඛනය
- හදිසි අවස්ථාවකදී දැන්විය යුතු දෙමාපිය/ භාරකරු ලිපිනයන්.28 නිවැරදි ආරම්භයට
- පාලිකාවන්ගේ පුද්ගලික ලිපිගොනු
- දරුවන්ගේ සෞඛ්‍ය වාර්තා
- දරුවන්ගේ ප්‍රගති වාර්තා
- තොග පොත
- ලොග් පොත
- මූල්‍යමය වාර්තා
- වාර/ වසර වැඩසටහන්
- දෙමාපිය රැස්වීම් වාර්තා
- මධ්‍යස්ථාන පාලක කමිටු රැස්වීම් වාර්තා

### 7.5 ආගමික පරිසරය

- ආගම ඇදහීම දෙමාපිය අනුමැතිය ඇතිව සිදුවේ
- ආගමික වතාවත් සඳහා සුදුසු ස්ථානයක් සපයා ඇත
- විශේෂ ආගමික දින උත්සවාකාරයෙන් සැමරේ

## 7.6 කාර්ය මණ්ඩල අවශ්‍යතා

### *7.6.1 පාලිකාවන්*

- සෑම ළමයින් 20 කට එක් පාලිකාවක් බැගින් සිටි
- පාලිකාවෝ පිලිගත් ආයතනයකින් වෘත්තීය පුහුණුව ලබා ඇත
- පාලිකාවෝ සේවාස්ථ පුහුණුව ලබා ඇත

### *7.6.2 සහාය කාර්ය මණ්ඩලය*

*පහත සඳහන් කාර්ය සඳහා සහායකයින් ඇත.*

- ගොඩනැගිල්ල, වැසිකිලි හා අවට පිරිසිදු කිරීමට
- ළමුන්ගේ පවිත්‍රතාවය පවත්වා ගැනීමට
- කෑම පිලියෙල කිරීමට සහ කෑමෙන් පසු පිරිසිදු කිරීමට

## 7.7 දෙමාපිය සහ පරිපාලන සහාය

- පාලක මණ්ඩලයක් ඇත
- ගුරු දෙගුරු සංගමයක් ඇත

## 7.8 වැඩ සැලැස්ම

**සංවර්ධන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් තුළ පහත දැක්වෙන අංග ඇතුලත්ය.**

- දවසේ ආරම්භක වැඩ පිළිවෙල
- ආගමික වතාවත්
- එළිමහන් ක්‍රීඩා හා ක්‍රියාකාරකම්
- කෙටි විවේක
- සැලසුම් ගත ක්‍රියාකාරකම් සහ තේමා ඇසුරෙන් නිර්මාණශීලී ප්‍රකාශනය (මීට නිරීක්ෂණය, ගවේශණය, සවන්දීම, අදහස් හුවමාරුව, කථනය, චිත්‍ර ඇඹීම්, භූමිකා නිරූපනය ආදිය තුළින් නිර්මාණශීලීත්වය ප්‍රකාශනය, පෙර කියවීම, පෙර ගණිතය ආදිය අයත් වේ.)
- ආහාර විවේකය
- නිදහස් ක්‍රීඩා ඉගෙනුම් කව ඇසුරෙන්
- සාමුහිකව,තනි තනිව කරන වෙනත් ක්‍රීඩා
- ගායනය, රංගනය ආදිය මගින් සෞන්දර්යාත්මක වින්දනය
- කථාන්තර
- මූලික සෞඛ්‍ය පුරුදු සහ තම තමාගේ කටයුතු කර ගැනීමට අදාල ක්‍රියාකාරකම්
- පවිත්‍රතාව පවත්වා ගැනීම
- එදිනෙදා ජීවිතයට සහ සමාජ, සංස්කෘතික අනුකලනයට අදාල අත්දැකිම් සහ කුසලතා
- විසිරයාම හා සම්බන්ධ චාරිත්‍ර

*(**සැලකිය යුතුයි :** ක්‍රියාකාරකම් ලැයිස්තුවේ සඳහන් සියල්ල දිනක වැඩ සටහනකට හෝ අනුගමනය කළයුතු අනුපිළිවෙලකට අදාල නොවේ.)*

**සේවා සැපයුම්**

වෙනත්

ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා යෝජිත සැලසුම ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය
පුහුණු ආධාර
ද්‍රව්‍යමය ආධාර
මූල්‍යමය ආධාර

ළමා සත්කාරක සේවා

ප්‍රාදේශීය ඊ.සී.සී.ඩී කමිටුව
දිස්ත්‍රික් ඊ.සී.සී.ඩී
කමිටුව
පළාත් ඊ.සී.සී.ඩී කමිටුව

ළමා ලේකම් කාර්යාලය
ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය
ග්‍රාමීය
ඊ.සී.සී.ඩී.
ඛමිටුව

සංවර්ධන
මධ්‍යස්ථාන
ගුරු මණ්ඩල සංගමය
ගුරු--දෙගුරු සංගම්
පෙරපාසල් ගුරුවරියන්/
පාලිකාවන්
පරිත්‍යාගශීලීන් /
දානපතියන්
අමාත්‍යාංශ
විශ්ව විද්‍යාල
පුහුණු ආයතන
රාජ්‍ය නොවන සංවිධාන
සම්පත්දායකයින්
ගුරු උපදේශක
ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරී
ඊ.සී.සී.ඩි
දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී
ඊ.සී.සී.ඩි
පළාත් සම්බන්ධීකරණ නිලධාරී
ඊ.සී.සී.ඩි
සංවර්ධන මධ්‍යස්ථාන පොකුරු
ළමා මිතුරු සංවර්ධන මධ්‍යස්ථාන